# මක්ෂිම් ගෝර්කි ගේ මහා නවකතාව




සිංහලට නගන්නේ
**දොස්තර කීර්ති කුලසේකර**
(MBBS Mphil PhD)
ල වරෝබ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය සහ බෙන්ඩිගෝ මූලික රෝහලේ වෛද්‍ය නිලධාරී.

**සුමිත් පෙරේරා ගේ සිතුවමින්**

එක් හැන්දෑවක කෑම වේලාවෙන් පසු කාමරයට ගිය පාවෙල් ජනෙල් රෙද්ද වසා දමා අසල තිබු මේසය ළඟ හිඳ ගත්තේය.

මේසයේ මුල්ලකට වූ ඔහු පොතක් කියවන්නට පටන් ගත්තේය.

ඔහුගේ කුප්පි ලාම්පුව (බල්බ් එකකින් හැදු) හිසට ඉහලින් බිත්තියේ එල්ලෙමින් තිබිණි.

දැන් පාවෙල් බිමට නැඹුරු කරගත් හිසින් යුතුව පොත තුලට එබී සිටියි.

මේ අතර අම්මා කුස්සියේ වලං පිඟන් අස් පස් කරයි.

කුස්සියේ වැඩ අහවර කල අම්මා තම අත් දෙක පිහිදමින් සෙමින් සෙමින් පාවෙල් සිටින දෙසට පියමන් කලාය.

එක් වරම හිස එසවූ පාවෙල් වචනයකුදු නො-දොඩා අම්මා දෙස හෙලුයේ ප්‍රශ්නාර්ථ යක් සහිත බැල්මකි.

ලනෑ මොකුත් නෑ පාෂා.. මම මේ නිකන් මේ



පැත්තට ආවේ.ල

හනි හනිකට එසේ පැවසු අම්මා ඉතා ඉක්මනින් එතැනින් ඉවත් වුවේ තම ඇහි බැම නොඉවසිල්ලෙන් මෙන් නටවමිනි.

කුස්සියට ගිය මව මොහොතකට ගල් ගැසුණාය. එකතැනම සිට ගෙන බර කල්පනාවක නියැලී සිටි ඇගෙන් දිස්වූයේ තුස්නිම්භූත වූ ස්වභාවයකි.

මොහොතක් කල්පනාවේ නිමග්නව සිටි කුස්සියට ගොස් අත සේදුවාය. නැවතත් ආපසු හැරී තම ආදරණීය පුතා වෙත පිය මැන්නාය.

ල පුතේ මම උඹෙන් අහන්න මයි හිටියේ ල කියමින් මෘදු ස්වරයකින් තම පුතා ඇමතුවාය.

ලමොනවද උඹ මේ හැම වෙලාවෙම ඉස්පාසුවක් නැතුව කියවන්නේ?ල

පාවෙල් තමා කියවමින් සිටි පොත පසෙකින් තැබුවේය.

"අම්මා .. මෙතනින් වාඩිවෙන්න"

අම්මා ඔහුගේ පසෙකින් වාඩි වුයේ පුතුගේ ඇගේ වදින නොවදින ගානටය.

මව සිය හිඳ ගැනීමේ ඉරියව්ව ඊගසක් මෙන් වන්නට කෙලින් වුයේ කිසියම් තීරණාත්මක එහෙත් වේදනාත්මක තොරතුරුක් පිළිබඳව ඉව වැටීමෙන් මෙනි.

අම්මා දෙස එක එල්ලේ නොබැලු පාවෙල් එතරම් සැර කටහඬකින් නොවුනත් ස්තීර සාර හඬකින් මෙසේ පැවසුවේය

"මම තහනම් කල පොත් පත් කියවනවා"

"ඒවා කියවන එක තහනම් කරලා තියෙන්නේ ඒවායින් අපේ ගැන, කම්මලේ වැඩ කරන මිනිසුන්ගේ ජිවිත ගැන සත්‍යය කියැවෙනවා"

**කර්මාන්ත ශාලා එන්න එන්න දියුණු වෙනවා. මිනිස්සු මැරිලා යනවා ඒවාට කඹුර කඹුර වැඩ කරලා.**

"මේ පොත් රහසිගතව මුද්‍රණය කරපුවා"

"මම මේවා කියවන වා කියලා අහුවුනොත් මාව හිරේ විලංගුවේ දාන්න පුළුවන්"

"එහෙම වුනොත් මම හිරේ යන්නේ වෙන මොකවත් නිසා නෙවෙයි මට ඇත්ත දැන ගන්න ඕනෑ නිසා"

අම්මාට එක් වරම තම හුස්ම හිර වූවාක් මෙන් දැනිණි.

ඇයට සිය පෙනහළු තුල සිට ඉහලට ආ ගුලියක් වැනි යමක් තම උගුරේ සිරවුවාක් වැනි හැඟීමක් දැනේනට විය

ඈ සිය දෙනෙත් පුළුල්ව විවර කර තම ආදරණීය පුතු දෙස බැලූවාය.

ඇයට තමා බලාසිටින්නේ තම සුරතල් පුතු දෙස නොව කිසියම් අමුතු , අලුත් පුද්ගලයෙකු දෙස යැයි වැනි හැඟීමක් ඇතිවිය.

ඔහුගේ කටහඬද වෙනස්ය. එහි ගැබ්වී තිබුනේ පහත් එහෙත් ගැඹුරු හා තිරසාර ස්වරයකි.

තම සිහින් උඩු රැවුල දැඟිලි වලින් පිරිමදිමින් කතා කල ඔහු අසමාන්‍ය ලෙස කාමරයේ මුල්ලකට නෙත් යොමා සිටින්නට විය.

මේ අතර අම්මා තම පුතු ගැන බෙහෙවින් බියට සහ විස්සෝපයට පත් වුවේ ඔහු ගැන සියුම් කේන්තියක් ඇති කර ගත්තාය.

"ඇයි පාෂා උඹ මෙහෙම කරන්නේ ? මට කියලා දාහක් ඉන්නවද .. උඹ විතරනේ ඉන්නේ ?

ඔහු තම හිස එසවුවේය. අම්මා දෙස එක එල්ලේ බලා පහත් ඉතා සංවර ස්වරයකින් යුතුව මෙසේ පැවසීය.

"මට සත්‍යයදැන ගන්න ඕනෑ"

ඔහුගේ හඩ එතරම් තීව්ර නොවිය. එහෙත් එය ස්ථිර සාර බවක් පෙන්වීය. ඔහුගේ ඇ ස්

අධිෂ්ඨාන ශිලිව දිළිසුනේය.

මව තම හිත පතුලෙන්ම තේරුම් ගත් දෙයක් විය . ඒ තම ආදරණීය පුතා ඔහුගේ ජීවිතය කිසියම් අද්භූත එමෙන්ම නීරස දෙයකට සම්පූර්නයෙන්ම කැපකර ඇති බවයි.

ඇයගේ ජිවිතයේ සිදු වූ සියල්ල ඇයට දැනුණේ

නොවැළැක්විය හැකි දේවල් ලෙසය.

ඒ නිසාම කිසිවක් නොසිතා සිදුවෙන හැම දෙයක්ම භාර ගැනීමට ඇය හුරුවී සිටියාය.

මෙවරත් එසේමය. පාශා මෙසේ පවසද්දීත් ඇය නිහඬව වැළපුනාය. තම පුතා හා කියන්නට ඇය හට වචන නැති විය.

එහෙත් ඇය තම හදවතෙන් වැලපුණෝ එය ඒ වන විටත් අධික කණගාටුව සහ ආතතියකින් යටපත් වී තිබියදීය.

"අම්මා ((.. අඬන්න එපා ..." පාවෙල් ඉතා මෘදු සහ කරුණාවන්ත හඬකින් පැවසීය.

අම්මාට දැනුණේ ඔහු ඇයගෙන් සදහටම සමුගෙන යන්නට සැරසෙන බවකි.

"හිතලා බලන්න... මොන වගේ ජීවිතයක්ද ඔයා ගෙවන්නේ කියලා"

"ඔයාට දැන් වයස හතළිහක් "

"ඔයා ජිවත් වුනාද? .. එකට හිටපු මුළු කාලෙම තාත්තාගෙන් ගුටි කාපු එක විතරයි වුණේ"

"මට දැන් තේරෙනවා තාත්තා එයාගේ කාලකන්ණි කම නිසා උපන් කේන්තිය පිටකලේ ඔයාගේ ශරිරයට..."

"එයාගේ ජිවිතේ පුරා තිබුණු කාලකන්ණිකම..."

"ඒ කාලකන්ණිකම එයාගේ ජිවිතේ සම්පූර්ණයෙන්ම තදකරගෙන හිටියේ ..."

"...එයා වත් දැනගෙන හිටියේ නෑ ඒක එයාගේ ජීවිතේට ඇතුළු වුණේ කවදාද කියලා."

"තාත්තා අවුරුදු තිහක්ම කම්මලට වැඩ කරා■ එයා පටන් ගනිද්දී ඒකෙ තිබුණේ ගොඩනැගිලි දෙකයි. දැන් ඒක හතක් වෙනකම් වැඩි වෙලා."

"කර්මාන්ත ශාලා එන්න එන්න දියුණු වෙනවා. මිනිස්සු මැරිලා යනවා ඒවාට කඹුර කඹුර වැඩ කරලා.

අම්මා තම පුතුට සවන් දුන්නාය. ඉතා උද්යෝගයෙන් සහ විමතියෙන් යුතුව සවන් දුන්නාය.

ඔහුගේ ඇස් ප්‍රටබෝධමත් කාන්තියකින් දිළිසුණෝය.

මේසයේ ඉදිරියට නැඹුරු වූ ඔහු තම මව වෙත තව තවත් සමීප වුවේය.